# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# ශ්‍රී ලංකාව
## **වැඩ සහයක (කොන්ත්‍රාත් පදනම මත)**

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පහත සඳහන් තනතුර සඳහා යෝග්‍ය සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැඩ සහයක (කොන්ත්‍රාත් පදනම මත)**

1. අටවන ශ්‍රේණිය සමත් විය යුතුය.
2. විදුලි කාර්මික ශිල්පය පිළිබඳ රජයේ පිළිගත් ආයතනයක සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරූ අයෙකු විය යුතුය.
3. වයස: අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
4. NVQ – Level 3 සම්පූර්ණ කර තිබීම සහ ජලනල කාර්මික කටයුතු කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

මාසික දීමනාව : (මූලික වැටුප - 23,500/- + ජීවන වියදම් දීමනාව + රු. 5,000/- + රු. 5,000/- සහ (EPF) 12% (සේවායා) + සේවක භාරකාර අරමුදල් (ETF) 3% (සේවායා) ප්‍රතිලාභ)

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

කොන්දේසි :-

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ආරම්භයේදී මාස 06ක කාලයක් සඳහා ලබා දෙන්නකි. කොන්ත්‍රාත් කාලසීමාව තුළ ඉටුකරන කාර්යයන් පිළිබඳ සෑහීමට පත්විය හැකි නම් තෝරා ගනු ලබන අයදුම්කරුගේ කාලසීමාව දීර්ඝ කිරීම පිළිබඳ සලකා බැලීමට මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකියාව තිබේ. මෙම තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද මත ප්‍රමුඛතා ලැයිස්තුගත කරන අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත් "නියෝජ්‍ය ලේඛකාධිකාරී, මානව සම්පත් අභිවර්ධන ආයතනය, අංක 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07" යන ලිපිනයට 2025.04.01 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඔබගේ දුරකතන අංකය හා ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් හා දුරකතන අංකයන් අයදුම්පතෙහි සඳහන්කර තිබිය යුතු අතර, අදාල සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සේවා කාලය තහවුරු කිරීමට අදාල සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
මානව සම්පත් අභිවර්ධන ආයතනය
අංක 275,
බෞද්ධාලෝක මාවත.
කොළඹ 07

2025.03.20